දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்விநிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

# ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (ඔක්තෝබර් - 2019)

## ආර්ථික විද්‍යාව 111

## ECG 3 ව්‍යවහාර ආර්ථික විද්‍යාව

**ඕනෑම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
**මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10කි.**
**සෑම ප්‍රශ්නයකටම දෙනු ලබන ලකුණු සංඛ්‍යාව එයට අදාළව දක්වා ඇත.**
**(කාලය පැය තුනයි)**

1 (i) 1977 දී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ දක්වන්න. (ලකුණු 08)

(ii) මෙම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත කුමන බලපෑමක් ඇති කළේ ද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 12)

2. (i) දරිද්‍රතාව නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයෙහි හේතු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) "1990 සිට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩු වෙමින් පවතී". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 08)

3. (i) ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධන වියදම්වල උපනතීන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සමාජ සුභසාධන වියදම්වල වැදගත්කම දක්වන්න. (ලකුණු 05)

(iii) සමාජ සංවර්ධන දර්ශක පහක් දක්වන්න. (ලකුණු 05)

4. (i) සේවා වියුක්තිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය සඳහා බලපාන ප්‍රධාන හේතු දක්වන්න. (ලකුණු 05)

(iii) "ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය 5% වඩා අඩු බැවින් ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය ප්‍රශ්නයක් නැත". මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5. (i) පසුගිය දශක හතර තුළ ශ්‍රී ලංකාවේ අඩු වෙමින් පවතින ජනගහන වර්ධනය සඳහා බලපෑ හේතු විස්තර කරන්න. (ලකුණු 10)

(ii) නිදහසේ සිට ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනයෙහි ආර්ථික බලපෑම විභාග කරන්න. (ලකුණු 10)

6. (i) ශ්‍රී ලංකාවේ කාර්මික (ද්විතීක) සහ සේවා (තෘතීක) අංශවල ප්‍රධාන සංරචක විස්තර කරන්න. (ලකුණු 10)

(ii) නවීන අර්ථ ක්‍රමයක් තුළ සෑම අංශයක ක්‍රියාකාරිත්වය කෙතරම් දුරට එකිනෙක මත තීරණය වන්නේද? උදාහරණ භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

7. (i) ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික ඵලදායිතාව වැඩි කිරීමට රජය විසින් ගෙන ඇති ප්‍රතිපත්ති මිනුම් මොනවාද? (ලකුණු 14)

(ii) ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික අංශය මත මෙම ප්‍රතිපත්තිවල බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 6)

8. (i) වෙළෙඳ ශේෂය සහ වර්තන ගිණුමේ ශේෂය අතර වෙනස්කම් මොනවාද? (ලකුණු 05)

(ii) 1977 සිට ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ප්‍රශ්නයට බලපෑ අභ්‍යන්තර සහ බාහිර සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 15)

9. (i) "ශ්‍රී ලංකාවේ විශාල අයවැය හිඟයට ප්‍රධාන හේතුව රජයේ වියදම්වල අති විශාල වැඩිවීමයි". සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ අයවැය හිඟය පියවීමට වෙළෙඳපොළ ණය ගැනීම්වල බලපෑම් මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. ශ්‍රී ලංකාවට අදාළව පහත සඳහන් ඕනෑම **හතරක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න. (එකකට ලකුණු 05 බැගින්)

(i) ආදායම් අසමානතාව
(ii) අපනයනවල සංරචක
(iii) සේවා අංශයේ වැදගත්කම
(iv) එකතුකළ වටිනාකම් බද්ද
(v) ආර්ථික වර්ධනය
(vi) දරිද්‍රතාව අඩු කිරීමේ උපක්‍රම

---